# 12 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



12.1 රූපය - අන්තිම රාත්‍රී භෝජනය

නියම වේලාව පැමිණි කල, උන්වහන්සේ කෑමට හිඳගත් සේක. ප්‍රේරිතයෝ (අපෝස්තුලුවරු) ද උන්වහන්සේ සමග හිඳගත්හ. උන්වහන්සේ පූප ගෙන තුති පුද, ඒවා කඩා, ඔවුන්ට දී, "ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය; මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ"යි වදාළ සේක. එලෙස ම භෝජනයෙන් පසු කුසලාන දී, "මේ කුසලාන ඔබ උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුම ය.

(ලූක් 22:14, 19-20)

ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක. දිව්‍ය පූජාව පවත්වන විට ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රි භෝජනයේ දී සිදු කළ පිළිවෙතට අපි සහභාගි වෙමු. එයට කතෝලික ජන වන්දනාවේ කේන්ද්‍රස්ථානය හිමි වේ. මන්ද යත් අන්තිම රාත්‍රී භෝජනයේ දී මෙන් ම දිව්‍ය පූජාවේ දී ද අප ව ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදයෙන් උන්වහන්සේගේ ම ශ්‍රී ශරීරයෙන් හා ශ්‍රී රුධිරයෙන් පෝෂණය කරන සේක.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ උන්වහන්සේ ජීවමාන ව වැඩ සිටින සේක. එබැවින් අපි උන්වහන්සේ භක්තියෙන් ලබා ගත යුතු වෙමු. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට යන විට දෑත් වැඳගෙන ගොස් උන්වහන්සේ ලබා ගෙන දෑත් වැඳගෙන ආපසු පැමිණ දණ ගසා විනාඩි කිහිපයක් භක්තියෙන් යාච්ඤා කිරීමට අමතක නොකරන්න. ඔබ පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත් දිනය නැවත සිහියට නගා ගන්න. එදින ඔබ තුළ තිබූ භක්තිය හා ගෞරවය අදත් තිබේදැයි මෙනෙහි කරන්න.



12.2 රූපය - ජීවමාන ජේසු අපගේ හදවත්වලට ලබා ගනිමු

## දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ

1. දේව ප්‍රසාද නිධානයකි
2. භෝජනයකි
3. යාගයකි
4. ගිවිසුමකි
5. ස්තුති කිරීමකි
6. සිහි කිරීමකි.

## දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු

### 1. මෙල්කිසෙදෙක්ගේ යාගය

පූජක රජතුමකු වූ මෙල්කිසෙදෙක් ප්‍රථම වරට පූප හා මිදියුස ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ ය.

තව ද සාලෙම්හි රජ වූ පරමෝත්තම දෙවියන් වහන්සේගේ පූජක වූ මෙල්කිසදෙක් රොටි සහ මිදියුස ගෙනැවිත් ඔහුට ආශීර්වාද කරමින්, "අහසත් පොළොවත් මවා වදාළ පරමෝත්තම දෙවියන් වහන්සේ ආබ්‍රම්ට ආශිර්වාද කරන සේක්වා! ඔබේ සතුරන් ඔබ අතට පාවා දුන් පරමෝත්තම දෙවියන් වහන්සේට තුති පැසසුම් වේවා!යි කිවේ ය. ආබ්‍රම් ද සියල්ලෙන් දසයෙන් එකක් ඔහුට දුන්නේ ය.
(උත්පත්ති 14:18-20)

### 2. මන්නා භෝජනය

දෙවියන් වහන්සේ කාන්තාරයේ දී ආහාර නොමැති ව කුසගින්නේ සිටි ඉශ්රායෙල් ජනතාවට මන්නා භෝජනය ලබා දී ඔවුන් පෝෂණය කළ සේක (නික්මයාම 16).

### 3. ඉශ්රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය

ඊජිප්තුවේ වහල්කමින් මිදී පොරොන්දු දේශයට පිටත් වීම සිහි කිරීම සඳහා සැම වසරක් පාසා ම පාස්කු භෝජනය පැවැත්වීමේ දී ඉශ්රායෙල් ජනතාව නුමුහුන් පූප අනුභව කළහ; කුසලානෙන් පානය කළහ (නික්මයාම 12).

### 4. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය

පන්දහසකට පූප බෙදා දීමේ ප්‍රාතිහාර්ය නව ගිවිසුමේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට පූර්ව සලකුණකි.



12.3 රූපය - පන්දහසකට පූප බෙදා දීමේ ප්‍රාතිහාර්යය

ශ්‍රාවකයෝ ආපසු පැමිණ, තමන් කළ සියලු දේ උන්වහන්සේට දැන්වූහ. එවිට උන්වහන්සේ ඔවුන් සමග විවේක සුවය සඳහා බෙත්සයිදා නම් නුවරකට ඉවත් ව ගිය සේක. එහෙත් සමූහයෝ එපවත් අසා, උන්වහන්සේ පසු පස ගියහ. උන්වහන්සේ ඔවුන් පිළිගෙන, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට වදාරා, සුවය අවශ්‍ය වූ අය සුව කළ සේක. සවස් වේගන එත් ම, දොළොස් දෙනා උන්වහන්සේ වෙත අවුත්, "මෙහි අප සිටින්නේ පාළු පෙදෙසක බැවින්, අවට නියම් ගම් හා ගොවි ජනපදවලට ගොස් නවාතැන් හා කෑම සපයාගන්නා පිණිස සමූහයන් හැරිය මැනවැ"යි කීහ. උන්වහන්සේ, "ඔබ ඔවුන්ට කෑමට යමක් දෙන්නැ"යි වදාළ සේක. "අප ළඟ නම් රොටි පහකට හා මසුන් දෙදෙනෙකුට වඩා නැත; කළ යුතු දේ නම්, අප ගොස් මේ මුළු සෙනඟට කෑම මිල දී ගැනීම ය"යි ඔවුහු කීහ. එසේ කීවේ පුරුෂයන් පන්දහසක් පමණ එහි සිටි බැවිනි. එවිට උන්වහන්සේ, "ඔවුන් පණස් දෙනා බැගින් කාණ්ඩ වශයෙන් හිඳුවන්නැ"යි ශ්‍රාවකයන්ට වදාළ සේක. ඔවුහු එසේ කොට, හැම දෙන ම හිඳගන්නට සැලැස්සූහ. එකල උන්වහන්සේ රොටි පහත් මසුන් දෙදෙනාත් ගෙන, ස්වර්ගය දෙස බලා, ආශීර්වාදය පවසා, ඒවා කඩා, සමූහයා ඉදිරියෙහි තබන පිණිස ශ්‍රාවකයන්ට දුන් සේක. සියල්ලෝ ම කා තෘප්තියට පැමිණියහ. ඔවුන් කෑ පසු ඉතිරි වූ කැබලිවලින් කූඩා දොළොසක් රැස් කර ගන්නා ලදි.

(ලූක් 9:10-17)

අන් අයගේ කුසගින්නේ දී ජේසුස් වහන්සේ ඔවුන් පෝෂණය කිරීමට කටයුතු කළ සේක. අප ද අන් අයගේ කුසගින්නේ දී අපි සතු දේ අන් අය සමග බෙදා ගනිමු. ඒ සඳහා ජේසුස් වහන්සේ අපට ආරාධනා කරන සේක.

**ක්‍රියාකාරකම**

1. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ තුනක් ලියන්න.
2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් ලියන්න.
3. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය ඔබේ වචනයෙන් ලියා දක්වන්න.
4. දිව්‍ය සත්ප්‍රසාදයෙන් ජීවමාන වූ ජේසුස් වහන්සේ ලබා ගත්, ඔබ කරන යහපත් ක්‍රියා තුනක් ලියන්න.

**ජීවිතයට බිඳක්**

***දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයේ වටිනාකම තම ජීවිතය තුළින් ජීවත් කරවීමට උත්සාහ කරන්න. ඒ සඳහා ජීවමාන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට යාච්ඤා කරන්න.***